## (ඒ) ලංකාවේ පෞද්ගලික ආයෝජන සමීක්ෂණය

1965 දී මහ බැංකුව පෞද්ගලික ආයෝජන පිළිබඳව දීප ව්‍යාප්ත සමීක්ෂණයක් කොට නිමා කළේ ය. මේ සමීක්ෂණයේ පරමාර්ථය වූයේ, පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදන සංඛ්‍යා තොරතුරු වල පැවැති ලොකු අඩුවක් සපුරාලීමය. 1963 අප්‍රේල් වල සිට 1964 මාර්තු දක්වා ලංකාවේ පෞද්ගලික ආයෝජන පරිමාව හා සැකැස්ම පිළිබඳව සංඛ්‍යා තොරතුරු රැස් කරන ලදී ගෘහස්තයන් විසින් ආයෝජනය සඳහා මුදල් සොයාගත් මාර්ග පිළිබඳ සංඛ්‍යා සහ අනෙකුත් සමහර සංඛ්‍යා තොරතුරු රැස් කැරිනි.

අර්ථ ක්‍රමයේ පහත දක්වෙන අංක ඇතුළත් වන පරිදි උප සමීක්ෂණ මාලාවක් මගින් මේ සමීක්ෂණය පැවැත්විණි.

(අ) ධීවර පවුල්

(ආ) ගැමි පවුල්

(ඇ) නාගරික නිවාස ඉදි කිරීම

(ඈ) සමාගම් (කෘෂිකාර්මික, කාර්මික හා සේවා)

(ඉ) නො-සමාගම් ආයතන (කෘෂිකාර්මික, කාර්මික හා සේවා)

සියල්ලම ගණන් ගෙන පූර්ණ සමීක්ෂණයක් සඳහා උත්සාහ දරා ඇති සමාගම් සම්බන්ධයෙන් හැර, අනෙකුත් අංශ, නිදර්ශකයක් සැකැසීමෙන් සමීක්ෂණය කරන ලදී. ඒ ඒ අංශ වලට ගැලපෙන සේ නිදර්ශක වෙන් වෙන් ව සකසන ලදී.

ධීවර හා ගැමි පවුල් පිළිබඳ උප සමීක්ෂණ මහ බැංකුවේ පරීක්ෂකයන් විසින් පෞද්ගලිකව, හමුව සාකච්ඡා කිරීමෙන් පවත්වන ලදී. අනෙකුත් උප පරීක්ෂණ තැපැල් මගින් යැවූ ප්‍රශ්නාවලියකින් හා සමහර අවස්ථා වල පෞද්ගලිකව ගොස්, පවත්වන ලදී.

මේ උප පරීක්ෂණ වලින් සොයාගත් ප්‍රධාන කරුණු මහ බැංකුවේ විවරණිකා වල පළ කැරිණි. සියලු ම සංඛ්‍යා සටහන්, සමග එක් වෙළුමක් වශයෙන් සම්පූර්ණ වාර්තාව, යථා කාලයේදී පළ කිරීමට යෝජනා කොට ඇත.

පූර්ණ සමීක්ෂණයකට තැත් කළ සමාගම් සම්බන්ධයෙන් ලබන සහයෝගය සාමාන්‍ය අනුපාතිකයක් වශයෙන් දක්වතොත්, සියයට 75 ක් පමණ විය. ආයෝජන සංඛ්‍යා තොරතුරු, ප්‍රශ්න මාලාවට තොරතුරු සැපයූ, සමාගම් සම්බන්ධයෙන් පමණක් වෙයි. උතුරු හා නැගෙනහිර ප්‍රදේශ වල ධීවර අංශය සම්බන්ධයෙන් කැරුන සමීක්ෂණය, 1964 දෙසැම්බර් මාසයේ පැවැති, සුළි සුළඟින් ඇති වූ අලාභහානි හා අවහිර නිසා අතහැර දැමීමට සිදු විය. සමීක්ෂණ ප්‍රතිඵල වලට මේ ප්‍රදේශ ඇතුළත් නැත. ආයෝජන ගණන් බැලීමේ දී, මුදලින් කැරුන වියදම් වලට අමතරව, වර්ග වලින් කැරුන වියදම, තමාගේ ශ්‍රමය සඳහා ආරෝපිත අගය සහ උපකරණ වල අගය ද ගණන් ගනු ලැබිය.

සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව, 1963-64 පෞද්ගලික අංශයේ මුළු වශයෙන් රුපියල් කෝටි 55·55 ක ආයෝජනයක් සිදු වී ඇත. ඉදි කැරුන නිවාස වල වටිනාකම රුපියල් කෝටි 30·3 වී ඇති අතර. ගොඩනැගිලි ඉදි කිරීම තවත් රුපියල් කෝටි 2·96 කට ගණන් බලා ඇත. කම්හල්, යන්ත්‍ර සහ අනෙකුත් සියළුම උපකරණ සඳහා කර ඇති ආයෝජනය රුපියල් කෝටි 7·3 කි. වගාව, නැවත

වගාව සහ වගාව මෝරන තෙක් නඩත්තුව සඳහා වූ වියදම රුපියල් කෝටි 7·12 ක් විය. තොග ප්‍රමාණය ද ආයෝජනයේ කොටසක් වශයෙන් ගත් අතර, වැඩි වූ තොග වල වටිනාකම රුපියල් කෝටි 5·93 ක් විය.

ගෘහසථ අංශයේ මුළු ආයෝජනය රුපියල් කෝටි 37·47 ට ඇස්තමේන්තු කොට ඇත. මෙයින් ගැමි ගෘහසථයන්ගේ ආයෝජනය රුපියල් කෝටි 30·05 ක් ද, නගරබද ගෘහසථ ආයෝජනය රුපියල් කෝටි 6·52 ක් ද, ධීවර ගෘහසථ ආයෝජනය රුපියල් කෝටි 0·9 ක් ද වී ඇත. සංස්ථාපිත අංශයේ ආයෝජනය රුපියල් කෝටි 14·72 ක් විය. මෙයින් රුපියල් කෝටි 6·03 ක් කාර්මික සමාගම් විසින් ද, රුපියල් කෝටි 4·43 ක් සේවා සමාගම් විසින් ද, රුපියල් කෝටි 4·26 ක් කෘෂිකාර්මික සමාගම් විසින් ද ආයෝජනය කොට තිබිණි. නොසමාගම් ආයතන විසින් තවත් රුපියල් කෝටි 3·36 ක් ආයෝජනය කොට තිබිණි. කෘෂිකාර්මික හා ඇස්තමේන්තු ගත ආයෝජනය රුපියල් කෝටි 2·69 ක් වූ අතර, කාර්මික ආයතන වල ආයෝජනය රුපියල් කෝටි 1·42 ක් විය. සේවා ආයතන වල තොග අඩුවීම නිසා රුපියල් කෝටි 0·75 ක නිරායෝජනයක් සිදු විය.